# ගුත්තිල කාව්‍යයෙන් හෙළිවන වෑත්තෑවේ හිමියන්ගේ ස්වාධීන කවිචින්තාව

බෝලියද්දේ ධම්මකුසල හිමි

## හැඳින්වීම

ගුත්තිල කාව්‍යය සිංහල පද්‍ය සාහිත්‍යාවලියෙහි විශිෂ්ට ස්ථානයක් හිමි කරගත් කාව්‍ය ග්‍රන්ථයකි. කෝට්ටේ යුගයට අයත් ගුත්තිල කාව්‍යය වෑත්තෑවේ හිමියන් විසින් රචිත වූවක් බව පිළිගැනෙයි. කිවිමග සමග දහම් මග සුසංයෝගයෙන් රචිත කෘතියක් වශයෙන් ගුත්තිල කාව්‍ය හැඳින්විය හැකිය. චිරන්තන සිංහල පද්‍ය කාව්‍ය ග්‍රන්ථ අතර ගුත්තිලය තරම් විද්වතුන්ගේ ගෞරවයට හා විචාරයට ලක්වූ වෙනත් පද්‍ය කාව්‍ය ග්‍රන්ථයක් නොමැති තරම් ය. ගුණවර්ධන වාසලමුදලි විසින් ලියන ලද 'ගුත්තිල කාව්‍ය වර්ණනා' නැමැති කෘතියේ ගුත්තිල කාව්‍ය සිංහල සාහිත්‍යයෙහි සියලු කාව්‍යයන්ට වඩා උතුම් බව ප්‍රකාශ කෙරෙයි. මීට අමතරව මාර්ටින් වික්‍රමසිංහ විසින් ලියන ලද 'ගුත්තිල ගීතය' මගින් ගුත්තිල කාව්‍යය විශිෂ්ට කාව්‍යයක් බව පෙන්වා දෙයි. ගුත්තිලය සිංහල සාහිත්‍යයේ ශ්‍රේෂ්ඨතම කාව්‍යය වශයෙන් අද්‍යතන රසිකයාට හඳුන්වා දෙන ලද්දේ මාර්ටින් වික්‍රමසිංහ විසින් බව ප්‍රකාශ කරන ගුණදාස අමරසේකර කවි ප්‍රතිභාව හා කල්පනා ශක්තිය දැක්වෙන කාව්‍ය ව්‍යාපාරයෙහි උසස් ම ප්‍රතිඵල දැකිය හැකි සිංහල කාව්‍යය ගුත්තිලය බවත්, මුල, මැද හා අග යන තුන් තැන. එකක් අනිකෙක් අනායාසයෙන් ගැළපෙන සන්දර්භය ගුත්තිල කාව්‍යයේ තරම් නිර්මල ව අනික් එකදු සිංහල කාව්‍යයක දැකිය නොහැකි බවත් මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ අදහසට එකග වෙමින් ප්‍රකාශ කරයි.[1]

සිංහල පද්‍ය සාහිත්‍යාවලියෙහි විශිෂ්ටතම නිර්මාණයක් ලෙස අගය කෙරෙන ගුත්තිල කාව්‍යය එහි ශ්‍රේෂ්ඨත්වය විදහාපාන අංග අතරින් ගුත්තිල කවියා සතු ස්වාධීන කවි චින්තාව මුඛ්‍ය ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකිය. මීට පෙර බොහෝ කවීන් සංස්කෘත

කව්මග අනුව යමින් කාව්‍යයන් රචනා කළ බව මුවදෙව්දාවත, සසදාවත, කව්සිළුමිණ ආදී පද්‍ය කාව්‍යයන්ගෙන් පැහැදිලි වේ. සංස්කෘත කාව්‍යායෙහි භාවිත වන ශෘංගාර රසයෙන් තොරව රසවත් කාව්‍යයක් නිර්මාණය නොකළ හැකි යයි, චිරන්තන සිංහල කවීන්ගේ පිළිගැනීම වූ බව ඔවුන් විසින් රචනා කරන ලද මෙම පද්‍ය කාව්‍යයන්ගෙන් වැටහෙයි. එම පිළිගැනීමෙන් ඉවත්වූ දේශජ කවිත්වයෙන් යුතු කවියෙක් පහළ වී නම් ඒ කවියා වූ කලී වෑත්තෑවේ හිමියන්ය.[2] උන්වහන්සේ සාම්ප්‍රදායිකත්වය පදනම් කොටගත් පද්‍ය කාව්‍යයක් රචනා කරනු වෙනුවට සම්ප්‍රදායට ගැති නොවූ ස්වාධීන කව්මගක් ඔස්සේ ගුත්තිලය රචනා කළහ. සංස්කෘත අලංකාර වාදයට ගැති නොවූ මෙම ස්වාධීන කවි චින්තාව, කාව්‍යයට උචිත ලෙස ජාතක කතාව යොදා ගැනීම, චරිත, පදමාලාව හා භාෂාව ආදී සෑම අංශයන්ම අධ්‍යයනය කළ හැකි අතර එම ස්වාධීන කවි චින්තාව අධ්‍යයන කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වෙයි.

**ප්‍රවේශය**

චිරන්තන සිංහල පද්‍ය සාහිත්‍යයෙහි අලංකාරවාදයට වහල් නොවූ දේශජ කවිත්වයෙන් යුත් කාව්‍යයක් සොයා ගැනීම ඉතා අපහසු කාර්යයකි. සෑම පද්‍ය නිර්මාණකරුවෙක්ම සංස්කෘත අලංකාර වාදය ගුරු කොට ගැනීම මෙයට ප්‍රධාන හෙතුවයි. එහෙත් අනෙකුත් පද්‍ය නිර්මාණකරුවන්ගේ කවි චින්තාව අලංකාරවාදයේ බලපෑමෙන් යටපත් වුවත්, එසේ යටපත් වීමට ඉඩ නොදුන් එකම කවියා ලෙස වෑත්තෑවේ හිමියන් හඳුනා ගැනෙයි. බොහෝ දුරට ගතානුගතිකත්වයෙන් තොර වී දේශජ කවිත්වයෙන් යුක්තව කවි ලියූ උන්වහන්සේගේ ස්වාධීන කවි චින්තාව ගුත්තිල කාව්‍යයෙන් හඳුනාගත හැකිය.

ගුත්තිල කාව්‍යය වෑත්තෑවේ හිමියන්ගේ සහජ කවිත්වය මත වර්ධනය වූවක් බව පෙනේ. මේ පිළිබඳ අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ වෑත්තෑවේ හිමියන් සංස්කෘත කාව්‍ය නැමැති උක් දඬු, සිංහල කාව්‍යයන් නැමැති උක් පැණියට හරවන තෙලියතක් නොවූයේ උන්වහන්සේ සංස්කෘත කාව්‍යයන් එතරම් ඇසුරු නොකළ නිසා බවත් උන්වහන්සේගේ කවිත්වය ධර්ම සාහිත්‍යය ආශ්‍රයෙන් වැඩුණක් නිසා බවත් ප්‍රකාශ කරයි.[3] ඒ අනුව ගුත්තිල කාව්‍යය අනෙකුත් කාව්‍යයන්ට

වඩා වෙනස් මගක් ගත් කාව්‍යයක් බව පැහැදිලිය. එනම් වෑත්තෑවේ හිමි සංස්කෘත අලංකාර වාදයට ගැති නොවී නිදහස්ව රචනා කළ කාව්‍යයකි.

ගුත්තිල කවියාගේ මෙම ස්වාධීන කවි චින්තාව වඩා හොඳින් වැටහෙන්නේ ඊට පෙර කාව්‍ය කරණයේ නියුතු කවීන් අනුගමනය කළ කාව්‍ය රචනා මර්ගය පිළිබඳ අධ්‍යනය කිරීමේ දී ය. විශේෂයෙන් පොළොන්නරු, දඹදෙණි යුගයන්හි රචිත මුවදෙව්දාවත, සසදාවත, කව්සිළුමිණ ආදී අනෙකුත් පද්‍ය නිර්මාණ අලංකරවාදයට වහල්ව නිර්මාණය කළ බව විද්‍යමාන වේ.

**කිවිබැව් කිවිදුමේ - කුසුම් සැපතෙහි විපුල්**
**පෙලෙ බෝසත් සර වැනුම් - වියතෙ මුව පත් වේවා[4]**

කාව්‍ය කරණයෙහි කුසලතාව කාව්‍ය නැමැති ගසෙහි මල් හට ගැනීමයි. මේ මල් හටගැන්මේ හේතුවූ ඵලය නම් බෝධිසත්ව වර්ණනාවයි. ඒ ඵලය ව්‍යක්තයන්ගේ මුඛයට පත් වේවා, යනුවෙන් කවියා කරන ප්‍රකාශයෙන් එය පැහැදිලි වේ. ඛණ්ඩ කාව්‍යයක් වශයෙන් හඳුනාගැනෙන මුවදෙව්දාවත, සසදාවත වැනි ග්‍රන්ථයන් ද එම මග මඅනුගමනය කර ඇත. මෙම කාව්‍යයන් රචනා කළ කවීන්ට මෙන් ම ගුත්තිල කාව්‍යයටද වස්තු විෂය වී ඇත්තේ ජාතක කතාවකි. එහෙත් ගුත්තිලය අලංකාර වාදයට වහල් වූ කෘතියක් නොවේ. ගුත්තිල කාව්‍යයෙහි අව්‍යාජ සුන්දරත්වය, උන්වහන්සේ සංස්කෘත කාව්‍යයන් ඇසුර කළ බහුශ්‍රැත පඬිවරයකු නොවූ නිසා යැයි මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ප්‍රකාශ කරන්නේ එහෙයිනි.[5] ඒ අනුව ගුත්තිලය නිහතමානී කවියෙකු විසින් රචිත නිර්ව්‍යාජත්වයෙන් අනූන ජාතක කතාවක් වස්තු බීජ කරගත් ශ්‍රේෂ්ඨ කාව්‍යයකි.

**ග්‍රන්ථාරම්භය**

ගුත්තිල කාව්‍ය කිසිදු සම්ප්‍රදායකට ගැති නොවී රචනා කරන ලද බව ග්‍රන්ථය ආරම්භක පද්‍යයන්ගෙන් ප්‍රකට කරෙයි. අනෙකුත් පද්‍ය නිර්මාණකරුවන් මෙන් ම වෑත්තෑවේ හිමියන් ද තෙරුවන් නැමද කාව්‍ය ආරම්භ කිරීම ගුත්තිල කාව්‍යයෙන් පෙනේ. ගුත්තිල කාව්‍ය රචනයේ දී සම්ප්‍රදාය අනුව යමින් බුදුන්ට නමස්කාර කළ වෑත්තෑවේ

හිමි අවංක භක්ත්‍යාදරයෙන් යුක්තව සිතින් මවා ගත් බුදුරුව අබියස වැද වැටෙන්නේ උන්වහන්සේට ම ආවේණික කාව්‍යාත්මක ලක්ෂණ ප්‍රකට කරවමිනි.

**''සිය පින් සිරින් සරු**
**දෙතිස් ලකුණෙන් විසිතුරු**
**කෙලෙසුන් කෙරෙන් දුරු**
**වදිම් මුන් උතුමන් තිලෝ ගුරු''[6]**

තෙරුවන් නැමැදීම ගතානු ගතික ලෙස ම සිදු විනි නම් ගුත්තියට මේ ශ්‍රේෂ්ඨත්වය හිමි නොවන්නට ඉඩ තිබුණි. එහෙත් ස්වාධීන කවියෙකු වශයෙන් බුදුරුව අභියස වැඳ වැටෙන ආකාරයෙන් එය කර තිබීම වැත්තෑවේ හිමියන්ගේ ග්‍රන්ථාරම්භයේ එන තෙරුවන් නැම්දීමේ විශේෂත්වයයි. එහෙත් කාව්‍යශේඛර, සඳකිඳුරුදා කව ආදී කාව්‍යයන්හි බුදුන් නැමදීම ගුත්තිල කාව්‍යයේ තරම් නිහතමානී බවෙන් යුත් නැමදීමක් ලෙස සහෘදයාට නොදැනෙයි.

''පිරි සරසවියර ස
සුබ තරඟ නත මින් රැ ස
රන්වනඹරනිවෙ ස
වදිම් මුන් රජ සයුර සහතොස''[7]

''ගොසැති ලෝ ඇදුරු
තිරසර ගුණෙන් අදුරු
රාග දොස් අදුරු
වදිම් මුනි උතුමන් තිලෝ ගුරු''[8]

තෙරුවන් නැමදීමෙන් අනතුරුව අප කවියා පද්‍ය කාව්‍ය ආරම්භ කරන්නේ ද සිය ස්වාධීන කවි චින්තාව අනුව ය. අනෙකුත් සිංහල පද්‍ය සාහිත්‍යකරුවන් ගිය මඟ යමින් සිය පාණ්ඩිත්‍ය විදහාපානු වෙනුවට තමාගේ ඥානයේ ප්‍රමාණයෙන් බුදුගුණ කාව්‍ය රචනා කරන බව උන්වහන්සේ ප්‍රකාශ කරති. තමාට හැකි ප්‍රමාණයෙන් බුදුගුණ වර්ණනා කරන බව කවියා ප්‍රකාශ කරන්නේ පාණ්ඩිත්‍යය

වෙනුවට නිහතමානිත්වය ශ්‍රේෂ්ඨ කවියකු තුළ තිබිය යුතු අනිවාර්ය ගුණාංගයක් ලෙස ප්‍රකට කරවමිනි.

**''පෙර මහ කිවි වරණ**
**පැවසූ තිලෝගුරු බණ**
**මම මගෙ නැණ පමණ**
**කිමැයි වරදක් වේද කිකරුණ''[9]**

සිය නිහතමානිත්වය ප්‍රකට වන ලෙස වැත්තෑවේ හිමියන් විසින් පද්‍ය කාව්‍ය ආරම්භයේ කරනු ලබන ප්‍රකාශයෙන්, මහා කවීකාලිදාස සිය අවසාන මහා කාව්‍යය වූ රඝුවංශයෙහි ''කවීන් විසින් ලැබිය යුතු යසස පතන මා රඝුවංශ රචනයට කරන වෑයම උස් මිනිසකු විසින් නෙළාගත යුතු ඵල විශේෂයෙහි මිට්ටෙකු අත එසවීම වැන්න''[10] යනුවෙන් සඳහන් කළ ප්‍රකාශය සිහිගන්වයි. ගුත්තිල කතු හිමියන් කරන්නට යන කාර්ය තවත් පැහැදිලි උපමාවක් මගින් ඉදිරිපත් කරන්නේ තමා විශිෂ්ට කවියෙකු නොවූව ද පද්‍යයෙන් බුදුගුණ වැනීමට දරණ ප්‍රයත්නයේ අඩුවක් නොමැති ව සිදු කිරීමට දරණ උත්සහය පිළිබඳ ව සහෘදයාට වැටහෙන ආකාරයටය.

**''පරසතු මලින් පුද**
**ලද මුනි සඳුට දිය නඳ**
**වනපස මලින් පුද**
**කළැයි පවසනු කවර වරද ද''[11]**

දෙව්ලොව පිපෙන පරසතු මලින් පූජා ලැබූ බුදුන් වහන්සේට වනපස මලින් පූජා කිරීම කරව වරදක් වේද? යනුවෙන් ඉදිරිපත් කරන හැඟුම කතුවරයන් වහන්සේගේ නිහතමාන් බව මැනවින් පිළිබිඹු කරන්නක් වේ. සිංහල සාහිත්‍ය වංශයෙහි මෙතරම් නිහතමානි කවියෙක් නොමැති තරම් ය. වැත්තෑවේ හිමියන්ටම ආවේණික ලක්ෂණයක් ලෙස මෙය හඳුනාගත හැක්කේ අනෙකුත් පද්‍ය නිර්මාණකරුවන් සමග සංසන්දනය කර අධ්‍යයනය කිරීමේ දීය. කවිසිළුමිණ එම අවස්ථාව යොදාගනු ලබන්නේ සිය පාණ්ඩිත්‍යය ඉදිරිපත් කිරීම සඳහාය.

**''සරසවිය බැලුමසෙක්නි - වෙත්වා කිවි දෙනෝ**
**පෙදෙහි රසහව් විඳුනා - දෙනෙතා ඉතා දුලබෝ''[12]**

තමාගේ පාණ්ඩිත්‍යය යොදාගෙන රචිත මෙම කාව්‍යයෙහි රස භාව විඳිය හැක්කේ පණ්ඩිතයන්ට ම විනා වෙනකෙකුට නොවන බව කතුවරයා පෙන්වාදෙයි. සසදාවත කරුවා ද මේ හා සමාන ආකාරයට මෙම අවස්ථා ඉදිරිපත් කරයි.

**''බඳුතු කිවිමල්හු වැදැ මහ බෙලෙන් කව් මල්**
**තොර නො හසළ දනට පිරි සරම බර දැක්මෙන්''[13]**

කෝට්ටේ යුගයේ කාව්‍යකරණයේ නියුතු වෑත්තෑවේ හිමියන්ගේ ගුරුවරයා ලෙස පිළිගැනෙන තොටගමුවේ රහුල හිමියන් කාව්‍යශේඛරය රචනා කිරීමේ දී තම බහුශ්‍රැත භාවය නිසා උපන් ගර්වය අතිශයෝක්තියට නගා මෙම අවස්ථාව ඉදිරිපත් කෙරෙයි.

**''මෙකියන වදන් රැ ස**
**කිවිහුම දනිති ගුණ දො ස**
**දන්නා තැනට මි ස**
**වෙසෙස නොදැනෙයි රුවන් තතු ලෙස''[14]**

ඉහත ග්‍රන්ථාරම්භක පද්‍ය සමග සසදන විට ගුත්තිල කාව්‍යය ආරම්භ වන්නේ කොතරම් අනභිමානයෙන් යුක්ත වූ පැවසුමකින් දැයි මැනවින් වටහාගත හැකිය. ගුත්තිල කාව්‍යය සිංහල පද්‍ය කාව්‍ය ග්‍රන්ථ අතර සුවිශේෂී කාව්‍යයන් බවට පත් වීමට ග්‍රන්ථාරම්භක පද්‍යයන්ගෙන් පවා ප්‍රකට කෙරෙන වෑත්තෑවේ හිමියන්ගේ මෙම ස්වාධීන කවි චින්තාව හේතු වී ඇත.

**ජාතක කතාව කවියෙන් කීම**

අනල්ප බුද්ධ භක්තිය පිළිබිඹු වන පරිද්දෙන් ආරම්භක වශයෙන් කියන ලද පද්‍ය කීපයකින් අනතුරුව ජාතක කථාව කවියෙන් කීම අරම්භ කෙරෙයි. ආරම්භයේදී ම නගර වර්ණනයකට හා රාජ වර්ණනයකට අවස්ථාව එළඹුන ද කවියා රජගහනුවර එක පද්‍යයකින් වර්ණනා කොට ඊළග පද්‍යයෙන් බිම්සර රජුගේ නම

පමණක් සඳහන් කරයි. ඒ අනුව සංස්කෘත කවීන් අනුව නොයන වෑත්තෑවේ හිමි නගර වැනුමක්, රජ වැනුමක් කිරීමට තිබූ ඉඩකඩ උවමනාවෙන්ම ඉවත් කර ඇත. සංස්කෘත මහාකාව්‍යයන්ගේ ලක්ෂණ ඇතුළත් කිරීමේ අරමුණින් අනෙකුත් සිංහල පද්‍ය නිර්මාණකරුවන් සිය පද්‍ය කාව්‍යයන්ට ඇතුළත් කළ අනවශ්‍ය වර්ණනා ඇතුළත් නොකර කිව යුත්ත කෙටියෙන් ඉදිරිපත් කිරීම ගුත්තිල කාව්‍යයේ විශේෂ ලක්‍ෂණයක් බව මින් පැහැදිලි වේ. අනායාසයෙන් ගැළපී එන පද්‍ය සමූහයක් සහිත සන්දර්භය ගුත්තිලයේ තරම් අන් එකද කවක හෝ දක්නට නොලැබෙන්නේ මේ හේතුව නිසා ය.

රහල් හිමියන් විසින් මහාකාව්‍යයක් ලෙස රචනා කෙරෙන කාව්‍යශේඛරය සමග සසඳන විට එහි උචිතානුචිත බව නොසලකා මහකාව්‍යයට උචිත වර්ණනා ඇතුළත් කිරීම සඳහා විවිධ අවස්ථාවන් තනා ගැනීම නිසා සන්දර්භය අතින් දුර්වල වී ඇති අයුරු අධ්‍යයනය කළ හැකිය. එහි උයන් දියකෙළි වැනුම් කරන ලද්දේ ද අනවශ්‍ය අවස්ථා උපදවා ගැනීමෙනි. අනෙකුත් මුවදෙව්දාවත, සසදාවත යන කාව්‍යයන්හි මෙම ලක්ෂණය දැකිය හැකිය. ඒ අනුව ගුත්තිල කාව්‍යය යනු සාම්ප්‍රදායික කවි මඟ අනුව නොගිය ලේඛකයකු විසින් රචනා කරන ලද මනා සන්දර්භයකින් යුත් කාව්‍යයකි.

ගුත්තිල ජාතකය වස්තු විෂය කරගත් මෙම කාව්‍යයෙහි ජාතක කතාවේ එන වර්තමාන හා අතීත කතාව යන කතා දෙකම කාව්‍යයට නගා ඇත. කවි අනූවකින් පමණ වර්තමාන කතාව අවසන් කරණ ගුත්තිල කාව්‍යයේ අතීත කතාව පටන් ගන්නේ බරණැස්පුර වැනුමකිනි. එහිදී සංස්කෘත කවීන් විසින් කරන ලද නගර වර්ණනා ආදර්ශයට ගෙන ඇතත් අනවශ්‍ය ලෙස දීර්ඝ බවික් තොරව නගර වර්ණනය සිදු කරයි. මෙම වර්ණනයේ ඇති තවත් සුවිශේෂත්වයක් වන්නේ සාම්ප්‍රදායික පුර වැනුමෙන් ඔබ්බට ගොස් ස්වීය උපමා භාවිතයෙන් පුර වැනුම සිදු කිරීම කෙරෙහි කතුවරයා දැක්වූ දක්ෂතාවයි. බඹදත් වැනීමට අවශ්‍ය වූයේ ඔහු බරණැස රජකරන විට බෝසතුන් ගාන්ධර්ව කුළයක උපත ලත් හෙයිනි. ශ්‍රී මහා කාව්‍ය ලක්ෂණ ඇතුළු කරන්නට වුවමනා වී නම් කුමරයකුගේ උපත ලෙස එය කළ හැකිව තිබුණි. නමුත් ඒ සඳහා නොනැවතී බෝසත්ළදරු කාලය පද්‍ය දෙකකින් කරගෙන යයි

"කුමර කෙළි පුරුදුව
ගුරුන් පෙම් කොට තරිඳුව
දිසි පින් පිඬු බඳුව
සොඳුරු ගුත්තිල නමින් පසිඳුව"[15]

"සුරඟන වුව වෙතට
අඳනා සොඳුරු රුසිරට
නරඟරග පසු කොට
පැමැණි සපිරුණු සොළොස් වයසට"[16]

ක්‍රමයෙන් ගලා ආ ස්වාභාවික කතාසන්දර්භයට හානියක් නොවන ආකාරයෙන් මෙම වර්ණය කාව්‍යයට ඇතුළත් කිරීමට කතුවරයා සමත් වන්නේ සිය ස්වාධීන කවි චින්තාවෙන් කාව්‍යයක් රචනා කිරීමට කවියා ගත් උත්සහය නිසාය.

සැණකෙළි වැනුම ඉදිරිපත් කරන ගුත්තිල කතු එය තමාගේ සංකල්පයක් වුවත් අතිශයෝක්තියෙන් ඉදිරිපත් නොකරයි. සැණකෙළියක් පිළිබඳ නියම චිත්‍රයක් මවා පාමින් ඉතාමත් තාත්වික හා ස්වාභාවික සැණකෙළි වර්ණනයක් වෑත්තෑවේ හිමි ඉදිරිපත් කරයි.

"රුගත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින්
පුවත් නොදැන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්"[17]

කෙළිලොලින් සුරා බී රතැස් හා ගතද බමවමින් නටන්නෙක් හා ඔහු ඉදිරියේ වූ සුරා මණ්ඩපය ද සහෘද මනසේ මැවී පෙනෙන ආකාරයෙන් රචිත පද්‍යයකි. එවැනි දක්ෂතාවන් හැගෙන පරිදි මුලු සැණකෙළි වර්ණනය ම ඉදිරිපත් කර තිබීම ද වැදගත් ය. වර්ණනයන්ගේත් ශබ්දයන්ගේත් සංඝටනාව මනා ලෙස යොදාගෙන සජීවී වර්ණනයක් ලෙස කෙරෙන සැණකෙළි වර්ණනය රසවිඳින පාඨකයා ද සැණකෙළි භූමියේ සිටින සජීවී පුද්ගලයෙක් බවට පත්වීම නිරායාසයෙන් සිදු වන්නකි. මෙබඳු සජීවී වර්ණනයන් පිළිබිඹු වන කාව්‍යයන් දුර්ලබය. ඒ අතින් බලනක විට ගුත්තිලට හිමි වන්නේ ශ්‍රේෂ්ඨ ස්ථානයකි.

**ජාතක කතා කරුවා අනුගමනය නොකිරීම**

ශ්‍රේෂ්ඨ සාහිත්‍යකරුවෙකු වූ වෑත්තෑවේ හිමි අනෙකුත් පද්‍ය සාහිත්‍යකරුවන් මෙන් ජාතක කතාවක් කවියෙන් කීම ගුත්තිල කාව්‍ය රචනා කිරීමේ මුඛ්‍ය පරමාර්ථය කොට ගෙන නොමැත. උන්වහන්සේ ගුත්තිලයේ එන සෑම චරිතයක්ම පොදු මනුෂ්‍ය ගුණ ධර්මයන්ගෙන් යුක්ත චරිත ලෙස නිරූපණය කරයි. එනිසාම වර්තමාන තකාවේ එන දේවදත්ත චරිතයත් අතීත කතාවේ එන දේවදත්තගේ චරිතය නියෝජනය කරන මූසිලගේ චරිතයත් සර්ව සාධාරණව නිරූපණය කිරීමට සමත් වෙයි. එමෙන් ම ජාතක කතාවේ උත්කර්ශයට නැංවූ ගුත්තිල චරිතයට ද අසාධාරණයක් නොකරන වෑත්තෑවේ හිමි පොදු ජන සමාජයේ දැකිය හැකි සංකීර්ණ චරිතයක් ලෙස එය ප්‍රතිනිර්මාණය කරයි.

වෑත්තෑවේ හිමි ගුත්තිල කාව්‍යයේ චරිත නිරූපණය කිරීමේ දී අනුගමනය කරන ලද මුඛ්‍ය ලක්ෂණයක් ලෙස සෑම චරිතයක් ම සානුකම්පිත දෘෂ්ටියකින් නිරූපණය කිරීම දැකිවිය හැකියි. ගුරුන්ගෙන් ශිල්ප ඉගෙන ඔහු මහලු වූ විට ඔහු සමග වාදයට එළඹීමට තරම් අකෘතඥ දුෂ්ටයකු ව ලෝ වැස්සන්ගේ නින්දාවට භාජනය වී අවසානයේ පිරිහී විනාශ වී යන අන්දම දැක්වීම පරමාර්ථ කොට ගෙන ජාතක කතාවේ චරිත නිරූපණය කෙරෙයි. එහෙත් වෑත්තෑවේ හිමි කාගේත් වෛරය රැඳෙන වැරදි කළ දෙව්දත් දෙස පවා හෙළන්නේ සානුකම්පිත දෘෂ්ටියකි.

''ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ! දෙව්දත් නොදුටු මොක් පුර''[18]

''රා බී ඇවිසුණේ
දනපල් වරණ දරුණේ
මුනිඳු දැක දැමුණේ
කිමෙක දෙව්දත් තෙර නො දැමුණේ''[19]

මෙම පද්‍යවල 'අහෝ දෙව්දත්', 'දෙව්දත් තෙර', 'කිමෙක නොදැමුණෝ' යනුවෙන් යොදා තිබෙන යෙදුම්වලින් දෙව්දත් කෙරෙහි නැගෙන අනුකම්පාව පාඨකයා තුළ ඇති කරන්නට කතුවරයා සමත් වී ඇත. සාම්ප්‍රදායික දෘෂ්ටියෙන් බැහැර වූ ගුත්තිල කාව්‍යයට ආවේණික චරිත නිරූපණය හා චරිත නිරූපණයේ දී පිළිබිඹුවන දයානුකම්පාව හා ආත්ම සංයමය ගුත්තිල කාව්‍යයේ ශ්‍රේෂ්ඨත්වයට තවත් හේතුවක් වී ඇත.

කාව්‍යමය වශයෙන් උසස් පද්‍ය නිර්මාණයක් ලෙස ගුත්තිලය අගය කෙරුණ ද ගුත්තිලය කෙරෙහි පාඨක හා විචාරක යන දෙපිරිසගේ අවධානය යොමු වීමට හේතු වූ එක් සුවිශේෂී කාරණයක් වූයේ, එහි ඇති කාව්‍යමය අගයට වඩා ගුත්තිල හා මූසිල චරිත නිරූපණයේ දී වෑත්තෑවේ හිමියන් විසින් දැක්වනු ලැබූ සුවිශේෂීතාවයි.[20] ගුත්තිල හා මූසිල චරිත නිරූපණය පිළිබඳව විද්වතුන් දක්වන අදහස් විවිධය. මාර්ටින් වික්‍රමසිංහගේ අදහස වූයේ ගුත්තිලයේ මූසිල දුර්ජනයෙකු ලෙස සැලකිය හැකි ප්‍රවෘත්තියක් ගුත්තිලයෙහි දැකිය නොහැකි බවත්, ජාතක කතාකරුවාට වෙනස්ව යමින් ගුත්තිලගේ චරිතය සුදන චරිතයක් ලෙස නිරූපණය කර ඇති බවත් ය.[21] වික්‍රමසිංහගේ අදහස වී ඇත. ගුත්තිලයේ චරිත නිරූපණය කෙරෙහි අවධානය යොමු කරන යක්කඩුවේ හිමියන්ගේ මතය වූයේ වෑත්තෑවේ හිමියන් ගත් මඟ නිවැරදිය යන්නයි. මෙම විචාරයන් දෙදෙනාගේ අදහස් පිළිබඳ අවධානය යොමු කරන ගුණදාස අමරසේකර මහතා, මේ විවාදයෙහි අති මූලික දුර්වලතාවය ලෙස ගුත්තිල හා මූසිල චරිත නිරූපණය, කාව්‍යයෙහි ඇති මූලික පරමාර්ථය වන රස නිෂ්පාදනය මත තබා පිරික්සා නොබැලීම යයි ප්‍රකාශ කරයි.[22]

ජාතක කතා කර්තෘ ගත් මඟ නොගත් වෑත්තෑවේ හිමියෝ ගැඹුරක් දකින රචකයකු වශයෙන් පුද්ගල චරිත දෙස හෙලූ දෘෂ්ටිය ජාතක පොතින් පිළිබිඹුවන දෘෂ්ටියට වඩා ඉඳුරාම වෙනස් වූවකි. ජාතක කතාකරු ගුත්තිලට විරුද්ධ වී මූසිල තරඟ නැගීම ඉමහත් වරදක් කොට සලකා ගැරහුමට ලක්කරන්නේ සිය අරමුණු වූ බෝධිසත්ව චරිතය උත්කර්ශයට නැංවීම සඳහාය. එහෙත් විශිෂ්ට සාහිත්‍ය රචකයකු ලෙස වෑත්තෑවේ හිමියෝ මිනිස් චරිත විනිවිද බලා විවරණය කළහ. එසේ ම මිනිසුන් අතර ඇති වන විවිධ අන්දමේ

ගැටුම්වල දී පිටතට නොපෙනෙන තැන් සොයා ගොස් නිරූපණය කිරීමට උන්වහන්සේ සමත් වූහ. බෝධිසත්ව චරිතය නිරූපණය කරන ගුත්තිල පඬිතුමාගේ චරිතය පැසසුමට ලක්කර ''මූසිල හෙළා නොදකින ගුත්තිල කවියා'' ගුත්තිල දෙස මෙන් ම මූසිල දෙස ද හෙළන්නේ එකහා සමාන සානුකම්පිත දෘෂ්ටියකි. කවියා චරිතයන් දෙස හෙළන සානුකම්පිත දෘෂ්ටිය නිසා'' එම චරිතයේ පොදු මානුෂික දුර්වලකම්වලට ලක්වූවන් ලෙස රසිකයාගේ අනුකම්පාව දිනා ගනියි. බොහෝ රසිකයන්ගේ අවධානය ගුත්තිල කාව්‍යයට හිමි වූයේ ජාතක කතාවක් කවියෙන් කීමට වඩා සිය ස්වාධීන කවි චිනතාව මෙහෙයවා සාර්ථක පද්‍ය කාව්‍යයක් නිර්මාණය කිරීමට වෑත්තෑවේ හිමියන් දැරූ මෙම උත්සහය නිසාවෙනි.

**ජනකවි ආර පද්‍ය සාහිත්‍යයට යොදා ගැනීම**

කෝට්ටේ යුගයේ රචනා වූ පද්‍ය කාව්‍ය අතර ගුත්තිල කාව්‍යය ඇතැම් තැනෙක යොදා ගන්නා ජන කාව්‍ය ආභාසය ඉතා විශිෂ්ටය. ගැමි ජනයාගේ මුවින් නිරායාසයෙන් ගලා ආ ජනකාව්‍ය, සරල බස් වහරින් නිර්මාණය වූවාසේ ම නිර්ව්‍යාජතවය එහි මුඛ්‍ය ලක්ෂණයක් විය. ගුත්තිල කාව්‍යය, ගුත්තිලගේ ජයග්‍රහනයත් මූසිලගේ පරාජයත් ඉදිරිපත් කිරීමෙන් පසුව ගුත්තිල ලවා දෙව්ලොව දී වීණා වාදනය කිරීමට සලස්වා පසුව ඉදිරිපත් කෙරන දෙව්ලොව හා පින් ඵල වර්ණනා කරන අවස්ථාව නිරායාසයෙන් නිර්මාණය කර ඇති අතර එහි විද්‍යමාන සරල බස්වහරත් නිර්ව්‍යාජත්වයත් නිසාම ජනකවියේ ආභාසය කෙතරම් සාර්ථක ලෙස සිය පද්‍ය රචනා කිරීමේ දී කවියා ලබා ඇද්දැයි සිතෙයි.

**''කිමෙක කියනු සුරපුර සිරිසර වෙසෙස**
**මෙලොව සියක් අවුරුදු එහි එක දවස**
**එවැනි එ සුරපුර සිරිසැප ලබන ලෙස**
**කරව කුසල් තෙපි මඳකුත් නොව අලස''[23]**

**''ඇතෙක දෙතිස් කුඹු දළ සිවු සැටෙක් ඇති**
**ගෙයක රුවන් ටැම් සැත්තෑ දහස් ඇති**
**රියෙක යොදන ලද සුදු සිඳු දහස් ඇති**
**එසක සැපත් පවසා කිම ඉමෙක් නැති''[24]**

**''ගෙයක පැහැය ගවු දෙසියෙක දිසේයා**
**මලෙක සුවඳ සිවු සිය ගව් ඇසේයා**
**ගලෙක මොළොක උන් සක් නැබ වැසේයා**
**නො යෙ ක එසඟ සිරි පවසම් කෙසේයා''[25]**

ප්‍රතිභානයෙන් යුත් ශ්‍රේෂ්ඨ ජන කවියෙකුගේ ලක්ෂණ ගුත්තිලයෙන් මෙහිදී පෙන්නුම් කරනු ලැබේ. මේ අනුව ගුත්තිල කාව්‍ය නිර්මාණ ස්වරූපය අතින් පරිසමාප්තියට පත් මනාව පිහිටි අඟපසඟින් යුත් උත්තම ගණයේ කාව්‍යයක් වෙයි. අපගේ කාව්‍ය වංශය තුළින් එවැනි සුසංගත අඟපසඟෙන් සැදි අන් කාව්‍යයක් දැකගත හැකි යයි කිව හැකි නොවේ. මේ පරිසමාප්ත කාව්‍ය ස්වරූපය ගුත්තිල කාව්‍ය හිමිකරගෙන ඇත්තේ ජනකාව්‍ය ඇසුරෙන් යයි ගුණදාස අමරසේකර මහතා ප්‍රකාශ කරයි.[26] සංස්කෘත කාව්‍ය අලංකාරයන්ට මුල්තැන දී පද්‍ය නිර්මාණය කිරීම උසස් කොට සැලකූ බොහෝ කවීන් සිටි යුගයක ජනකාව්‍යයේ ආභාසය ලබා ගැනීමට වෑත්තෑවේ හිමියන් පසුබට නොවූ අතර එය උන්වහන්සේගේ අදීන කවි චින්තය ඉස්මතු කර දක්වන ප්‍රබල අවස්ථාවකි.

**උචිත විරිත් හා පද මාලාව තෝරා ගැනීම**

ගුත්තිල කවියාගේ අදීනත්වය හෙවත් ස්වාධීන කවි චින්තාව හෙළි කරන තවත් අවස්ථාවක් ලෙස උචිත විරිත් අනුව ඒ ඒ අවස්ථාවන් ඉදිරිපත් කිරීම දැක්විය හැකිය. මේ සඳහා විශිෂ්ට නිදසුනක් ලෙස සුරඟනන්ගේ නැටුම් වර්ණනය දැක්විය හැකිය. එම වැනුමේ දී උචිත විරිත මෙන් ම වදන් ද තොරාගත් වෑත්තෑවේ හිමි නැටුමේ රිත්මය පද සංඝටනාව තුළින් මතු කර දැකවීමට සමත් වෙයි.

**''රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා**
**රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනූ පා තබ තබා**
**කම්පසේ සැර දෙන ලෙසේ දෙස බල බලා නෙතගින් සබා**
**මම කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රඟසුබා''[27]**

වස්තුවට උචිත පදමාලාව හා විරිත තෝරාගෙන ඇති බැවින් වර්ණිත අවස්ථාව ඉතා ප්‍රබල ලෙස සහෘදයාට දැනවීමට කතුවරයා සමත් වෙයි.

**''පිපි සමන් කුසුමන් පටින් තන රන් හසුන් මන් මෙන්බැඳේ**
**ලඹ සවන් දිගු රන් පසින් දන නෙත් මුවන් බඳිමින් තඳේ**
**මඳ පවන් වැද ලෙල පහන් සිළු මෙන් රැගුම් දෙන රන් බඳේ**
**දිලි ඔවුන් රූ සිරිනුවන් වන් බඹ වුවන් දැහැනින් මිඳේ''[28]**

මද පවනේ රමණීයව සැලෙන පහන් සිළු මෙන් සුරඟනන් නැටූ බව පෙන්නුම් කෙරෙන මෙම පද්‍ය තුළින් සුරඟන රැගුම් මූර්තිමත් කිරීමට කතුවරයා සමත් වෙයි. මෙය වර්ණිත අවස්ථාවට උචිත විරිත හා පදමාලාව තෝරා ගැනීමේ කවියා පෑ දක්ෂතාවය මනාව පිළිබිඹු කරන අවස්ථාවකි.

**උපමා භාවිතය**

අලංකාර වාදය සිංහල පද්‍ය නිර්මාණයන්ට විශාල බලපෑමක් කළ විචාර වාදයකි. කවීන් භාවිත කළ අලංකාර අතර උපමා අලංකාරය විශේෂ වෙයි. සෑම පද්‍ය සාහිත්‍යකරුවෙක් ම සිය කාව්‍ය උපමාවෙන් අලංකාර කිරීමට අමතක නොකළහ. බොහෝ සම්භාව්‍ය පද්‍ය තුළ අප දකින්නේ සංස්කෘත සම්භාව්‍ය කාව්‍යයන්හි භාවිත සාම්ප්‍රදායික උපමා යොදා ගැනීමයි. එහෙත් ගුත්තිල කාව්‍යයේ ගැති බවින් තොරව ස්වීය නිර්මාණයක් ලෙස ගෙණ හැර දක්වන තවත් අවස්ථාවක් ලෙස උපමා රූපක භාවිතය පෙන්වා දිය හැකිය. උපමා රූපකයන්ගේ මනා සංකලනයෙන් නිපදවන අපූර්ව සෞන්දර්ය ගුත්තිලයේ අගය වැඩි කිරීමට සමත් වී ඇත. පෙර අත්බවක කළ දෙය වැසි තිබුණු අකාරය කතුවරයා දක්වන්නේ මේ අයුරිනි.

**හිම පටලෙන් වැසී**
**නො දිසි සිසි බිඹු සදිසී[29]**

ගුත්තිල කාව්‍යයේ උපමා භාවිය කාව්‍යයේ සෑම වර්ණනයක පාහේ දැකිය හැකි ය. වෑත්තෑවේ හිමියන් සිය කාව්‍ය අලංකාර කිරීමට අවශ්‍ය උපමා නිර්මාණය කරගැනීමේ දී අනායාසයෙන් සිදු කර ඇති බව පැහැදිලිය. අවස්ථාවට උචිත බව හා සිත්ගන්නා සුලු බව ගුත්තිල කාව්‍යයේ උපමාවන්හි සුවිශේෂ ලක්ෂණයකි. මූසිල වෙළෙඳුන් ඉදිරියේ වීණා වාදය කරන අවස්ථාවේ කවියා භාවිත කරන උපමා මේ සඳහා උදාහරණ කොට දැක්විය හැකිය. වෙළෙඳුන්

කෙසේ හෝ සතුටු කිරීමේ අරමුණින් මූසිලගේ වීණාවාදනයේ ඒ ඒ අවස්ථාවන් උපමා රූපක මගින් ගෙනැර දක්වන්නේ සිය ස්වාධීන කවි ශක්තියෙන් කවියා නිර්මාණය කරගත් උපමා භාවිතයෙනි. ඔහුගේ වීණා වාදනය නො ඇසුනවුන් විලසින් සිටින වෙළෙඳ ජනයා කෙසේහෝ සතුටු කරන්නේය, යන අදහසින් මූසිල දරන උත්සහය ඊ පහරට ද ඉලක්ක කළ නො හැක්කා වූ ලිහිණියකු අතෙන් අල්ලා ගැනීමට දරණ උත්සහයක් ලෙසට උපමා කර දකවන කවියා එයින් මූසිල දරණ උත්සාහය ව්‍යර්ථ එකක් බව ප්‍රබලව සහෘදයාට දැනවීමට සමත් වේ.

**''සැරයට ලක් නොවන**
**ලිහිණියකු අත් පසුරෙන**
**ගනිමැයි තැත් කරන**
**එකකු මෙන් ගායනා කරමින''**[30]

කතුවරයා යොදා ගන්නා මෙම උපමා අවස්ථාවට උචිත ලෙස සියුම් උපහාස රසයක් දැනෙන ආකාරයට යොදා ගැනීමට සමත් වෙයි. මූසිලගේ වීණා වාදනයෙන් සතුටු නොවන විට ලිහිල් සැදුමෙන් වීණාව සකස්කරගෙන නැවත වීණා වාදනය කිරීම පිළිබඳ ඉදිරිපත් කරන ආකාරය ද ඉතා උචිත උපමාවකින් දක්වා ඇත.

**''වෙසෙසින් නියම කොට**
**දුන්නත් ඉසුරු මුළු රට**
**තුටු නො වන එකකුට**
**ගමක් දෙන මෙන් සතුටු පඩුරට''**[31]

මෙලෙස වැත්තෑවේ හිමි ගුත්තිලයේ යොදා ගන්නා උපමා අනායාසයෙන් යොදාගත් සරල උපමා වුවද ඒ සියල්ල ඖචිත්‍යයෙන් පිරි උපමාවන්ය. අර්ථ රසයෙන් සිය කාව්‍ය අලංකාර කිරීමට මෙන් ම සහෘදයාට ඒ ඒ අවස්ථාවන් ප්‍රබල ලෙස දැනවීමට උන්වහන්සේ යොදා ගන්න මෙම උපමා හේතු වී ඇත. මෙබඳු ලිහිල් උපමා රූපක කාව්‍යයේ දී අනුගමනය කළ අන් එකද කවක් හෝ නැති තරම් ය. ඒ අනුව බලන විට ද ගුත්තිල කාව්‍යයට හිමිවන්නේ ශ්‍රේෂ්ඨ ස්ථානයකි.

**භාෂාව**

පොදු ජනතාව උදෙසා රචනා කෙරෙන පද්‍ය කාව්‍යයන්ට උචිත වූ භාෂා ශෛලිය සිය පද්‍ය රචනය සඳහා නිර්මාණය කරගත් වෑත්තෑවේ හිමියන් විසින් පොදුජනයා උදෙසා රචනා කෙරෙන පද්‍ය කාව්‍යවලට උචිත භාෂා ශෛලිය කෙබඳු ද යන්න පශ්චාත් කාලීන කවීන්ට ගුත්තිල කාව්‍ය මගින් හඳුන්වා දෙන ලදි. කෝට්ටේ යුගයේ විසූ රාහුල හිමි, වෑත්තෑවේ හිමි වැනි කවීන් විසින් සිය කවි බස තනා ගනු සඳහා නැගී සිටින්නට ඇත්තේ ජනකවියේ බස මත බව ද ගුණදාස අමරසේකර මහතාගේ අදහසයි.[32] ගුත්තිල කාව්‍යයේ භාෂාව පිළිබඳ අදහස් දක්වන වජිරඥාණ හිමියන්ගේ අදහස වන්නේ රත්නාවලී කර්තෘ ධර්මසේන හිමියන්ගේ භාෂා විලාසයත්, ගුත්තිලය ලියූ වෑත්තෑවේ හිමියන්ගේ භාෂා විලාසයත්, ඇතැම් කරුණුවලින් විශේෂ සමානත්වයක් තිබේදැ යි සසඳා බැලීම උචිත බවත්, භාෂාවේ සරල බව හා මිහිරි බව අතින් මේ ග්‍රන්ථ කතුවරුන් දෙදෙනාගේ භාෂා විලාස සමව පෙනෙන අතර එය එක් වැදගත් ලක්ෂණයක් බව උන්වහන්සේගේ අදහසයි.[33]

ගුත්තිලයෙහි ජනප්‍රිය භාවයට දැඩි වෙහෙසකින් තොරව පද්‍ය රස විඳිය හැකි ලෙස අනායාසයෙන් ගලා යන සරල හා කාව්‍යාත්මක වාග්මාලාව හේතු වී ඇත. පද්‍ය පුරාවට දැකිය හැකි මෙම භාෂා විලාසය වඩාත් කැපී පෙනෙන අවස්ථාවක් ලෙස වීණා තරගය පැවැත්වෙන අවස්ථාව පිළිබඳ වර්ණනා කිරීමේ දී කවියා යොදාගත් භාෂාව අධ්‍යයනය කිරීමෙන් වඩාත් හොඳින් අවබෝධ කරගත හැකිය.

**"වෙ සෙ සි න් යන නද දිගත පුරායා**
**අ ස මි න් තුරුහිස රඳන ගිරායා**
**උ මු වෙ න් ගත් මී අඹ මියුරායා**
**දැ මු වෙ න් වෙණනදමය මියුරායා "[34]**

වීණා තරගය පැවති අවස්ථාවේ වීණා නාදයේ මිහිර දැක්වීමට කාවියා යොදා ගන්නා සරල බස් වහර පොදු ජන කාව්‍යයකට උචිත බස් වහරක. ඒ අනුව වර්ණිත අවස්ථාවට, සිද්ධියට හා චරිතයට ගැළපෙන ලෙස බස සකස් කර ගැනීමට වෑත්තෑවේ හිමියන් දක්වන්නේ අපූර්ව ප්‍රතිභාවකි.

## නිගමනය

සිංහල පද්‍ය සාහිත්‍යාවලියේ තවත් එක් කාව්‍යයක් වූ ගුත්තිල කාව්‍ය නිර්මාණ ස්වරූපය අතින් පරිසමාප්තියට පත් මනාව පිහිටි අඟපසඟින් යුත් උත්තම ගණයේ කාව්‍යයකි. වෑත්තෑවේ හිමියන් රචනා කෙරෙන මෙම කාව්‍යයෙන් උන්වහන්සේ තුළ පැවති ස්වාධීන කවි චින්තාව ඉස්මතු වී පෙනේ. පද්‍ය කාව්‍ය ආරම්භ කරන අවස්ථාවේ සිටම එය අධ්‍යයනය කළ හැකිය. වස්තු විෂය තෝරා ගැනීම, තෙරුවන් නැමදීම, චරිත නිරූපණය, අවස්ථා නිරූපණය ආදී සෑම අංශයකින්ම සිය ස්වාධීනත්වය ඉස්මතු වී පෙනෙයි. විශේෂයෙන් චරිත නිරූපණය සම්ප්‍රදාය ගැති නොවී සිය පද්‍ය රචනා කරන බව වටහා ගැනීමට අවස්ථා බොහෝ ප්‍රමාණයක් ගුත්තිල කාව්‍ය තුළ දැකිය හැකිය. චිරන්තන සිංහල පද්‍ය සාහිත්‍ය තුළ ස්වාධීන කවි චින්තාවක් ඔස්සේ නිදහසේ පද්‍ය රචනා කළ එකම කවියා වෑත්තෑවේ හිමියන් බව කිව හැකිය. ඒ ස්වාධීන කවි චින්තාව නිසාම ගුත්තිල කාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යාවලියේ විශේෂ තැනක් හිමි කර ගැනීමට සමත් වේ.

## ආන්තික සටහන්


1. අමරසේකර, ගුණදාස, සිංහල කාව්‍ය සම්ප්‍රදාය. බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ, 1998, 120 පිටුව.
2. වික්‍රමසිංහ, මර්ටින්, සාහිත්‍යෝදය කතා. මහරගම, සමන් ප්‍රකාශකයෝ, 1963,72 පිටුව.
3. එම, 72. පිටුව.
4. ආරියපාල, ඇම්. බී. කව්සිළුමිණ. කොළඹ 10, ඇස් ගොඩගේ සහ සමාගම, 1994, 4 පිටුව.
5. වික්‍රමසිංහ, මර්ටින්, 1963,72 පිටුව.
6. ගම්ලත්, සුචරිත, ගුත්තිල කාව්‍ය විචාරය. කොළඹ 10,එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001, 11 පිටුව.
7. ධර්මාරාම හිමි, රත්මලානේ, කාව්‍යශේඛර මහාකාව්‍යය. කැලණිය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1966. 01 පිටුව.
8. ගුණවර්ධන, වී. වී. එස්. සඳ කඳුරු දා කාව්‍යය. කොළඹ 10, සමයවර්ධන (පෞද්ගලික) සමාගම, 2004, 25 පිටුව.

9. ගම්ලත්, සුචරිත, 2001, 20 පිටුව.
10. දේවානන්ද හිමි, කටුකුරුනදේ, රඝුවංශ සන්නය. මාතර, සීමාසහිත මාතර වෙළෙන්දෝ. 4 පිටුව.
11. ගම්ලත්, සුචරිත, 2001, 20 පිටුව.
12. ආරියපාල, ඇම්. බී.1994, 2 පිටුව.
13. වික්‍රමසිංහ, කේ. ඩී. පී, සස දා වත. කොළඹ, ඇම්. ඩී ගුණසේන සහ සමාගම, 1961, 2 පිටුව.
14. ධර්මාරාම හිමි, රත්මලානේ, 1966. 01 පිටුව.
15. ගම්ලත්, සුචරිත, 2001, 90 පිටුව.
16. එම, 91 පිටුව.
17. එම, 98 පිටුව.
18. එම, 53 පටුව.
19. එම. 50 පිටුව.
20. අමරසේකර, ගුණදාස, 1998, 122 පිටුව.
21. වික්‍රමසිංහ, මාර්ටින්, සිංහල සාහිත්‍යයේ නැගීම, දෙහිවල, තිසර ප්‍රකාශකයෝ, 1997, 217,218 පිටු.
22. අමරසේකර, ගුණදාස, 1998, 120 පිටුව.
23. එම. 271 පිටුව.
24. එම, 271 පිටුව.
25. එම, 272 පිටුව.
26. එම, 105 පිටුව.
27. සුචරිත ගම්ලත්, 2001, 195 පිටුව.
28. එම. 197 පිටුව.
29. එම, 77 පිටුව
30. එම. 107 පිටුව.
31. එම, 108 පිටුව.
32. එම, 105 පිටුව
33. වජිරඥාණහිමි, හොරණ, සිංහල සාහිත්‍ය රසාස්වාදය. කොළඹ, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 108 පිටුව
34. සුචරිත ගම්ලත්, 2001, 190 පිටුව.